# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ශ්‍රී ලංකා වරලත් ප්‍රවාහන ආයතනය
## (සංස්ථාගත කිරීමේ) (සංශෝධන)

**2000 අංක 8 දරන ශ්‍රී ලංකා වරලත් ප්‍රවාහන ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

පාර්ලිමේන්තු මන්ත්‍රීනි ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය විසින්
2021 අප්‍රේල් මස 23 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2021 අප්‍රේල් මස 15 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[48 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 12.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## ශ්‍රී ලංකා වරලත් ප්‍රවාහන ආයතනය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන)

**2000 අංක 8 දරන ශ්‍රී ලංකා වරලත් ප්‍රවාහන ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

පූර්විකාව

ශ්‍රී ලංකා වරලත් ප්‍රවාහන ආයතනය 2000 අංක 8 දරන පනත මඟින් සංස්ථාගත කරන ලද ආයතනයේ සංස්ථාගත සාමාජිකයින් විසින් එකී ආයතනයේ නාමය සංශෝධනය කිරීම සඳහා යෝජනාවක් සම්මතකොට ගෙන ඇති හෙයින් ද:

එකී යෝජනාව ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා එකී ආයතනයේ නාමය වෙනස් කිරීමට එකී ආයතනය විසින් ඉල්ලා ඇති හෙයින් සහ එකී ඉල්ලීමට ඉඩදීම ප්‍රඥාගෝචර වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය

**1.** මේ පනත 2021 අංක දරන ශ්‍රී ලංකා වරලත් ප්‍රවාහන ආයතනය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2000 අංක 8 දරන පනතට කරනු ලබන පොදු සංශෝධනය

**2.** (ශ්‍රී ලංකා වරලත් ප්‍රවාහන ආයතනය යන නාමයෙන් හෝ "ආයතනය" යනුවෙන් ලුහුඬින් හෝ ) ශ්‍රී ලංකා වරලත් ප්‍රවාහන ආයතන පනතෙහි නැතහොත් ඒ පනත යටතේ නිකුත් කරන ලද යම් දැන්වීමක, හෝ වෙනත් ලේඛනයක, පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, "ශ්‍රී ලංකා වරලත් ප්‍රවාහන ආයතනය" යන යෙදුම සඳහා "ශ්‍රී ලංකා වරලත් කාර්යෝපාය සහ ප්‍රවාහන ආයතනය" යන යෙදුම ආදේශ කරනු ලැබිය යුතු ය.

ගිවිසුම් ආදිය සම්බන්ධයෙන් ආරක්ෂා සැලසීම

**3.** මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවීමේ දිනයට පෙර "ශ්‍රී ලංකා වරලත් ප්‍රවාහන ආයතනය" විසින් හෝ එහි නමට හෝ සාදනු ලැබූ, නිකුත් කරනු ලැබූ හෝ ලියා අත්සන් කරනු ලැබූ සෑම ගිවිසුමක් ම, කොන්ත්‍රාත්තුවක් ම හෝ වෙනත් කවර වුව ද සාධන පත්‍රයක් නැතහොත් ලේඛනයක් ම මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයෙන් පසු "ශ්‍රී ලංකා වරලත් කාර්යෝපාය සහ ප්‍රවාහන ආයතනය" විසින් හෝ එකී නමට සාදනු ලැබූ, නිකුත් කරනු ලැබූ හෝ ලියා අත්සන් කරනු ලැබූ එකක් ලෙස සලකනු ලැබිය යුතු ය.

**4.** මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව